Sannasa
244 Princes Hwy
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
**www.sannasa.com**
email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

**වෙළඳ දැන්වීම් / Advertising**
03 8707 4604
0402 025 516
**email** ads.sannasa@gmail.com

**Account Details for Payments**

**Bank -** ANZ
**Branch -** 013312
**A/C number -** 254306608
**Name of A/C**
Sannasa News Group

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සේයා රූ / Photography**
Prasanna Kurukularatna

**සම්බන්ධීකරණය**

| | |
|---|---|
| **NSW**<br>Lakshman<br>Kodituwakku | **WA**<br>Ven Beruwala<br>Sobhitha Thero<br>Sri Lanka Perth<br>Budhdist Vihara |
| **QLD**<br>Ananada<br>Samaratunga<br>7, Stuart Place<br>Forest Lake<br>QLD 4078<br>(07) 3372 7958 | **ACT**<br>Asoka Nimalasiri<br>0400 429 031<br><br>**SA**<br>Chandra Eeriyagama<br>08 8331 2318 |


පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත




## සංවාදය හා විසංවාදය

විරුද්ධ මත ඉවසා සිටින්නට නොහැකි වීම ශ්‍රී ලාංකිකයන් අතර වේගයෙන් පැතිර යන්නේ රෝගයක් මෙනි. පුද්ගලයන් අතර පමණක් නොව දේශපාලන පක්ෂ හා සමාජ සංවිධාන අතර පවා මේ ව්‍යාධිය පැතිරෙමින් තිබෙයි.

අපේ සතුටට හේතු වුව ද නොවුවද යම් කරුණක් අරභයා අප දරන මතයට වඩා වෙනස් මතයක් දරන්නට කෙනෙකුට ඇති අයිතියට අප ගරු කළ යුතු ය. ඒ කරුණ අරභයා අපේ මතය පිළිබඳ සංවාදයක් මතු කළ හැකි වුව ද අප පළමුව අනෙකාගේ මතයට ඇහුම් කන් දී සිටිය යුතු ය. මේ ඉවසීම නැතිව යාම ඉතා අවාසනාවකි.

සංවාදයට හිතකර පරිසරයක් ඇති ඕස්ට්‍රේලියාව වැනි රටකදී පවා අපි අපේ සමාජයේ ඇති මේ දුර්ගුණය නිවැරදි කර නොගන්නේ කවර අභාග්‍යයටදැයි අපට නොවැටහෙයි. උගතුන් යයි අප අදහන වැදගතුන් යයි අප සළකන පුද්ගලයින් පවා විරුද්ධ මත ඉවසා සිටින්නට නොහැකි තැන කරන කියන දේ දකින විට අපට ඇති වන්නේ කණගාටුවකි.

එක්තරා දේශපාලන පක්ෂයක් මගින් පසුගියදා පවතවන්නට යෙදුණ සංවාදයක් කඩාකප්පල් කිරීම සඳහා සමාජයේ කැපී පෙනෙන යම් පුද්ලයින් කී දෙනකු විසින් රහසිගතව දියත් කරන ලදැයි පැවසෙන කුමන්ත්‍රණයක් පිළිබඳ කතාව දැන් පැතිරෙමින් තිබෙයි. පවතින රජය විවේචනය වීම නොරිස්සීමත් ඒ මගින් ලකුණු දමා ගැනීමට පොටක් පාදා ගැනීමටත් යන කරුණු දෙක සඳහාම මේ මහ මිනිසුන් කරන පහත් වැඩ කිසි ලෙසකින් වත් අනුමත කළ හැකි නොවේ. කුමන්ත්‍රණකාරී ලෙස සංවාදය කඩාකප්පල් කිරීමේ වෑයමක් දරනු වෙනුවට ඔවුනට කරන්නට තිබුණේ ඒ සංවාදයට සහභාගි වී කථිකයන් කියන්නේ කුමක්දැයි සාවධානව අසා සිට එයට විරුද්ධ මතයක් තමන්ට ඇත්නම් එය වැදගත් ලෙස ඉදිරිපත් කිරීමයි. එසේ නැතිව නූගත් මිනිසුන් මෙන් හැසිරෙන්නේ නම් අප ප්‍රදර්ශණය කරන්නේ අපේ නෙහැදියාවම මිස වෙනෙකක් නොවේ.

## මේ කොයි යන්නේ?

ශ්‍රී ලංකාව පුරා පැතිර ඇති අපරාධ රැල්ලේ නිමාවක් නැත. මිනීමරුම් මංකොල්ලකෑම් ස්ත්‍රී දූෂණ නොඇසෙන දිනක් නැති තරම් ය. මේ අපරාධ වලින් සෑහෙන ප්‍රමාණයකට පවතින රජයේ විවිධ මට්ටම් වල දේශපාලුවන් ගෑවී ඇති බවද පුවත්පත් බලන අයට රහසක් නොවේ.

ඒක්කෝ පළාත් සභාවක මන්ත්‍රී කෙනෙකි. නැත්නම් ප්‍රාදේශීය සභාවක දේසපාලුවෙකි. මේ එක් අයෙකුටවත් නිසි දඬුවමක් ලැබුණ බවක් නම් අප අසා නැත . මිනීමරුවෝ පාර්ලිමේන්තු යති. පාර්ලිමේන්තුවේ සිටින්නෝ මිනී මරති. කප්පම් ගනිති. සමාජ අපචාර කරති. කරවති. මත්ද්‍රව්‍ය ගෙන්වා බෙදාහරිති. රහසින් නොවේ. ප්‍රසිද්ධියේ ය. උන් ආරක්ෂා කරන්නට පාලකයෝ නීතියත් යුක්තියත් කැලයට විසිකරති. පොලීසියේ හෙළුව වසා ගන්නට දෑතක් මදිය. නීතිය වල් වැදී ඇත.

මේ රට මේ යමින් තිබෙන්නේ කොයිබට දැයි කල්පනා කරන විට අපේ රට තරම් අවාසනාවන්ත රටක් තවත් නම් නැතැයි අපට සිතෙයි.

**සංස්කාරක - සන්නස**



# පාර්ලිමේන්තුව හා භික්ෂුව

ප්‍රසිද්ධ රූපවාහිනී මාධ්‍යයන්ට වමාරා කෑම සදහා මේ දිනවල ලැබී තිබෙන අලුත්ම ආහාරය වූ කලී පූජ්‍ය පක්ෂයට පාර්ලිමේන්තුව තහනම් කිරීම සදහා ගෙන ඒමට නියමිත පනතයි.භික්ෂූන් වහන්සේලා පාර්ලිමේන්තුව නියෝජනය කිරීම උචිත ද නැද්ද යන්න එක්වරම විශාල ජාතික ප්‍රශ්නයක තත්වයට උසස් කරනු ලැබ තිබේ.මාධ්‍ය ආයතන ජනතාවගෙන් මේ පිලිබද අදහස් විමසති.එලෙස අදහස් පල කරන ජනයාගෙන් බහුතරය භික්ෂූන් පාර්ලිමේන්තුවේ සිටීම පිලිබද අප්‍රසාදය පල කරති.

දැනට හටගෙන තිබෙන විවාදයේ ස්වභාවය මෙසේය.භික්ෂූන් පාර්ලිමේන්තුවේ සිටීමට විරෝධය දක්වන අය එමගින් භික්ෂුවගේ ගෞරවය හෑල්ලු වන බව ප්‍රකාශ කරති.දිනපතා ඉංග්‍රීසි පුවත්පතකට සම්මුඛ සාකච්ඡාවක් දෙමින් මෙම පනත ගෙන එන්නට පුරෝගාමී වූ විජේදාස රාජපක්ෂ මන්ත්‍රීවරයා පවසා තිබුනේ එක්තරා අවස්ථාවක භික්ෂුවකගේ වෘෂන කෝෂ මිරිකීම දක්වා පාර්ලිමේන්තුව තුල ඇති වූ ගැටුම් දුරදිග ගිය බවයි.පනතට එරෙහි හෙල උරුමවාදීහු භික්ෂූන් පාර්ලිමේන්තුවේ සිට කළ "මෙහෙය" සිහිපත් කරති. කොටි පරද්දන්න උදවු කල හැටි, මතට තිත සදහා මුල පිරූ හැටි ආදී වශයෙනි.

අතුරලියේ රතන හිමිට අනුව මෙය භික්ෂූන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් උදුරා ගැනීමකි. සුලුතර ප්‍රජාවන්ගේ හා ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම් ලබටහිරල සංකල්ප වී පාර්ලිමේන්තු යාමට භික්ෂූන්ට තිබෙන අයිතිය පෙරදිග එකක් වනුයේ චතුස්කෝටිකයේ කවර කෝටියකට අනුවද යන්නට දාර්ශනික පිලිතුරක් අමාත්‍ය චම්පික රනවක අපට සපයනු ඇද්ද?

ප්‍රශ්නය පාර්ලිමේන්තු යාමෙන් භික්ෂූන්ගේ පූජනීයත්වය හෑල්ලූ වීම නම් අපට එම ප්‍රශ්නය තරමක් විවෘත තලයකට රැගෙන යා හැකි ය. පූජනීයත්වය යනු කුමක්ද? භික්ෂුව පූජනීය වනුයේ කවර අර්ථයකින්ද?

ප්‍රධාන සමාජ ජීවිතයෙන් බැහැරව සත්‍යය සෙවීම සදහා සිය ජීවිතය තවුස් වත් පිරීම උදෙසා කැපකිරීම පැරනි ඉන්දියාවේ පැවැති පරිචයකි. අතිශය පරමාර්ථ සහිත

4 වන පිටට